**ලංකා ලේලන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2017/2018**
**---------------------------------------------------**

ලංකා ලේලන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හෝ අනෙකුත් අදාල විගණන සාක්ෂි නොවීම නිසා 2018 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.9,800,924 ක පොදු සංචිතවල නිවරද්‍යතාවය තහවුරු කිරීමට නොහැකි වුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 කරුණු අවධාරණය කිරීම**

දේපළ, පිරියත හා උපකරණ යටතේ සටහන් කරන ලද සහ වර්තමානයේ සමාගම සතුව නොමැති සින්නක්කර ඉඩම් පිළිබද විස්තර කෙරෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 05 කෙරෙහි අවධානය යොමු කරවමි.

**2.1.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබද වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,

- විගණනය සඳහා අවශය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

**2.1.3 වෙනත් කරුණු**

**-----------------**

සමාගමේ 2018 මාර්තු 31 දිනෙන් අවසන් කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණු රු.623,473 ක් වටිනාකමැති ඉඩම්වල අයිතිය සමාගම සතු වුවද එම ඉඩම්වල පරිහරනය සමාගම සතු නොවීය.

**2.2 නීතිරීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, මූල්‍ය ප්‍රකාශන මාස 4 ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණු අතර, ඒ සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**------------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**------------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.68,068,266 ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාව රු.647,811,976 ක් විය.ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.579,743,710 ක වර්ධනයක් නිරීක්‍ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ ආශ්‍රිත සමාගමේ ආයෝජනයෙහි සාධාරණ අගය රු.574,598,750 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.**

**4. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------**

**4.1 කාර්ය සාධනය**

**-----------------**

සමාගම දීර්ඝ කාලයක සිට ක්‍රියාකාරී මෙහෙයුම් කටයුතුවල නොයෙදුණු අතර සමාලෝචිත වර්ෂය තුල සභාපති දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ලෙස රු.3,852,367 ක්ද, ඉන්ධන වියදම් ලෙස රු.487,431 ක්ද වශයෙන් එකතුව රු.4,339,798 ක මුදලක් ගෙවා තිබුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|
| (අ) ගිණුම්කරණය | මූල්‍ය පාලක විසින් විධිමත් අනුමැතිය සහිත ක්‍රියාවලියකින් තොරව ජර්නල් සටහන් ඇතුලත් කර තිබුණු අතර ජර්නල් සටහන් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) මානව සම්පත් කලමනාකරණය | අනුමත සංවිධාන ව්‍යුහයක් සහ කාර්ය මණ්ඩලයක් නොවීම. |